**ජාතික ගමනාගමන කොමිෂන් සභාව - 2022.**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කල මතය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරණු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් දැනට භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරිගණක මෘදුකාංග පද්ධතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 30,502,154 ක් වැයකර තිබුණද, අදාල පරිගණක මෘදුකාංග පද්ධතිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව දේපල හා පිරියත ලෙස ගිණුම්ගත කර එහි පිරිවැය වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුලදී ලියා හැරීමට කටයුතු නොකර නොනිමි වැඩ ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | 2023.04.19 වන දින මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කරන ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධව ගිණුම් තැබීම් සිදුකළ යුතු වේ. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.51,793,404 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ශේෂයට අදාලව ටෙන්ඩර් තැන්පතු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් එම වටිනාකමෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයේ දී නොහැකි විය. | පරිගණකගත කරන ලද ටෙන්ඩර් තැන්පතු ලෙජරයක් හා විස්තරාත්මක ලේඛන ගිණුම් අංශය තුල පවත්වාගෙන යනු ලැබේ. | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් ටෙන්ඩර් තැන්පතු ලේඛනයක් පවත්වාගෙන යා යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතනයේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව මෝටර් රථ වාහන සඳහා වාර්ෂිකව සියයට 20 ක් ක්ෂය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 6,069,363 ක් වූ මෝටර් වාහන වලට අදාලව ක්ෂය වෙන් කිරීම් කර නොතිබුණි. | වෙනස හඳුනාගෙන වැරදි නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. | ආයතනයේ වත්කම් ක්ෂය ප්‍රතිපත්තිය අනුව වත්කම් සම්බන්ධව ක්ෂය කලයුතු වේ. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය | යම් තැනැත්තෙකු වෙත 24 වගන්තිය යටතේ ලබාදෙන ලද මගී සේවා අවසර පත්‍රයක් වෙනත් තැනැත්තෙකුට පැවරිය නොහැකි විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී මගී සේවා අවසර පත්‍ර 33 ක අයිතිය පැවරීම සිදුකර තිබුණි. | මෙම වගන්තිය සංශෝධනය විය යුතු බවට කොමිෂන් සභාව හඳුනාගෙන ඇති අතර මෙම වගන්තිය සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. | පනතෙහි විධිවිධාන වලට පරිබාහිරව මගී සේවා අවසර පත්‍ර 33 ක අයිතිය පැවරීම සම්බන්ධයෙන් සොයා බලා ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 02 වන වගන්තිය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය තුල රු. 641,978,981 ක කෙටි කාලීන ආයෝජන සිදුකර තිබුණි. | මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලා ඇත. | මුදල් පනතේ විධිවිධාන වලට පරිබාහිරව කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර ඉදිරියේදී මුදල් පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමට වගබලා ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 (අ) | වාහන භාර නිලධාරියා විසින් තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් වාහන ලොග් සටහන් පොතක් තබාගෙන නිතිපතා එහි සියලුම සටහන් තැබිය යුතු වුවත් කොමිෂන් සභාවේ වාහන සඳහා ලොග් සටහන් පොත් නඩත්තු කර නොතිබුණි. | ලොග් සටහන් පොත් නඩත්තු කිරීමට සටහන් තබා ගන්නා බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි වලට පරිබාහිරව කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර ඉදිරියේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගත යුතුය. |
| (ඈ) | 2021 නොවැම්බර් 16 දිනැති පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර | රාජ්‍ය ව්‍යාපාර විසින් අදාල රේඛීය අමාත්‍යාංශයේ වියදම් දැරීම නොකල යුතු වුවත්, කොමිෂන් සභාව විසින් අමාත්‍යාංශයේ | ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිඛිත හා වාචික අනුමැතිය | චක්‍රලේඛ ප්‍රතිපාදන වලට පරිබාහිරව කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛයේ 6.8 වගන්තිය | පවත්වන ලද වැඩමුළුක් සඳහා රු.198,250 ක් හා අමාත්‍යවරයාගේ නිල නිවසේ ආරක්‍ෂක සේවා කටයුතු වෙනුවෙන් රු. 225,128 ක් ද වශයෙන් රු. 423,378 ක වියදම් දරා තිබුණි. | ලබාගෙන ඇත. | ක්‍රියාමාර්ග ගත යුතු අතර ඉදිරියේදී මු චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 188,183,231 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 106,376,247 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 294,559,478 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මාර්ග බලපත්‍ර ආදායම රු. 182,262,172 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2022 වර්ෂය තුල දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් තුල ඇතුලත් මාර්ග බලපත්‍ර ටෙන්ඩර් ආදායම සියයට 615 කින් වැඩි වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 3.03 ක් වන අතර එය ඉකුත් වර්ෂයේ අනුපාතය වන 3.25 ට සාපේක්ෂව අඩු අගයක්ව ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අන්තර් පළාත් බස් රථ සේවා සැපයීම සඳහා මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නිත්‍ය ක්‍රමවේදයක් සකස් කොට ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට කොමිෂන් සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි. | පනත සංශෝධනයට අදාල කාර්යයන් දැනට සිදු කෙරෙමින් පවති. | කොමිෂන් සභා පනත සංශෝධනය ප්‍රමාදවීමට හේතු සොයා බලා පනත සංශෝධනය කිරීමට කඩිනමින් කටයුතු යුතුය. |
| (ආ) | ලාභ නොලබන මාර්ග වල බස් සේවා සැපයීමේ අරමුණින් 2005 වර්ෂයේ සිට ගැමි සැරිය ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු අතර, 2022 වර්ෂය අවසන්වන විට ව්‍යාපෘති 11 ක් පමණක් ක්‍රියාත්මක තත්වයේ පැවති අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 1,287,864 ක් වැයකර තිබුණි. වාර්ෂික | සහනාධාර මුදල් වැඩි කිරීමට අරමුදල් ප්‍රමාණවත් නොවූ නිසා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිසු සැරිය නව සේවාවන් ආරම්භ කිරීම තාවකාලිකව නැවැත්වීමට අධ්‍යක්ෂ | අවශ්‍යතාවයන් හා අරමුදල් තත්වයන් නිසි පරිදි හඳුනාගෙන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමටත්, වෙන් කල ප්‍රතිපාදන නිෂ්චිත කාර්ායයන් වෙනුවෙන් වැය කිරිීමටත් වගබලා |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාකාරී සැලැස්ම අනුව පවත්නා සේවාවන් පවත්වාගෙන යාමට හා නව සේවා 40 ක් ආරම්භ කිරීමට රු. මිලියන 14.890 ක් වෙන්කර තිබුණ ද කිසිදු නව සේවාවක් ආරම්භ කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | මණ්ඩලය අනුමැතිය ලබාගෙන ඇත. | ගතයුතුය. |
| (ඇ) | කොමිෂන් සභාව වෙත 2021 නොවැම්බර් 26 දින ගාලු පාර කොරිඩෝවේ බස් රථ වල සවි කිරීම සඳහා GPS යන්ත්‍ර 500 ක් ප්‍රවාහන අමාත්‍යාංශයේ සහසර ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණ ද, 2023 පෙබරවාරි 16 දින වන විට සවි කරන ලද මුළු GPS ප්‍රමාණය 186 ක් වන අතර ඉතිරි උපකරණ 314 ප්‍රමාණය බස් රථවලට සවි කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණු අතර තවද ඉතිරි GPS උපකරණ වල වගකීම් කාලය ඉක්ම යාමට ආසන්න තත්ත්වයේ පැවතිණි. | මේ වන විට මෙම උපකරණ බස්රථවල සවි කිරීමට කටයුතු කරමින් පවතී. | අදාල උපකරණ කඩිනමින් භාවිතයට ගැනීමටත්, උපකරණ වල වගකීම් කාලය ඉක්ම යාමට ආසන්න තත්ත්වයේ පැවතියදීත් GPS උපකරණ සවි කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුලදී නිසි සැරිය සේවා පවත්වාගෙන යාමට හා නව ව්‍යාපෘති 100 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 34.5 ක් වෙන්කර තිබුණද, නව එක් සේවාවක් හෝ ආරම්භ කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | සහනාධාර මුදල් වැඩි කිරීමට අරමුදල් ප්‍රමාණවත් නොවූ නිසා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිසු සැරිය නව සේවාවන් ආරම්භ කිරීම තාවකාලිකව නැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාගෙන ඇත. | අවශ්‍යතාවයන් හා අරමුදල් තත්වයන් නිසි පරිදි හදුනාගෙන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමටත්, වෙන් කල ප්‍රතිපාදන නිශ්චිත කාර්‍යයන් වෙනුවෙන් වැය කිරීමටත් වගබලා ගතයුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව නිසි ඇගයීමකින් තොරව මාර්ග ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ 14 ක් සඳහා රු. 5,000,000 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.2,568,180 ක් වැයකර සමීක්ෂණ 17 ක් සිදු කර ඉතිරි ප්‍රතිපාදන වලින් අරමුණුගත කාර්යයන්ගෙන් බැහැරව බස් රථ පර්යන්ත වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා රු. 2,621,665 ක් වැයකර තිබුණි. | ඉදිරියේදී ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදී. | අවශ්‍යතාවයන් නිසි පරිදි හදුනාගෙන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමටත්, වෙන් කල ප්‍රතිපාදන නිශ්චිත කාර්‍යයන් වෙනුවෙන් වැය කිරීමටත් වගබලා ගතයුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයට අයත් වෑන් රථයක් රු. 283,135 ක වියදමක් දරා අළුත්වැඩියා කටයුතු සිදුකර භාවිතයට නොගෙන ආයතන පරිශ්‍රයේ ගාල්කර දිරාපත් වෙමින් පැවතුණි. | රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛන වලට අනුව අළුත්වැඩියාවන් සිදු නොකරන ලදී. | භාවිතයට ගත හැකි වත්කම් නිසිපරිදි ප්‍රයෝජනයට ගැනීමට නොපමාව කටයුතු කළ යුතු වේ. |